# ලංසු ආරාධනාවයි (IFB)
## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
## ආරක්ෂක සේවා සැපයීම-2024

කොන්ත්‍රාත් අංකය : UGC/ Admin/05/01

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙනුවෙන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) සභාපති විසින්, සුදුසුකම්ලත් හා නිපුණතා පූර්ණ ලංසුකරුවන් වෙතින්, අංක 20 වෝඩ් පෙදෙසේ, අංක 24 වෝඩ් පෙදෙසේ සහ කොළඹ 08, අංක 94/10, ආනන්ද රාජකරුණා මාවතේ කාර්යාල පරිශ්‍ර සඳහා ආරක්ෂක සේවා සැපයීම පිණිස මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

2. සේවා අවශ්‍යතාව පිළිබඳ විස්තරාත්මක තොරතුරු ලංසු ලේඛනයෙහි සඳහන්ව ඇත.

3. අපේක්ෂිත සේවා සැපයුම් කාලය දින 365 කි.

4. ජාතික තරඟකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.

5. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් අයදුම්කරුවන්හට අවශ්‍ය වැඩිදුර තොරතුරු ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්/සාමාන්‍ය පරිපාලන වෙතින් දුරකථන අංක 011-2685183 මගින් ලබා ගත හැකි අතර, කොළඹ 07 වෝඩ් පෙදෙසේ, අංක 20, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාන්‍ය පරිපාලන අංශයේ දී අදාල ලංසු ලේඛණ පරීක්ෂා කර බැලිය හැක.

6. ආපසු ගෙවනු නොලබන ශ්‍රී ලංකා රුපියල් තුන් දහසක් (3000/-) ගාස්තුවක් ගෙවීමෙන් හා ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් **2024.04.01** දින සිට, කාර්යාල වේලාවන් තුළදී රාජකාරී දිනවල උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, ඉංග්‍රිසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛණ කට්ටලයක්, කොළඹ 07, වෝඩ් පෙදෙසේ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්/සාමාන්‍ය පරිපාලන කාර්යාලයෙන් මිළදී ගත හැක. ගෙවීම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සරප් වෙත මුදලින්ම කළ යුතු වේ.

7. රාජ්‍ය ආයතන හැරුණු කොට,අනෙකුත් සියලුම ලංසුකරුවන් විසින් ආපසු ගෙවනු ලබන රුපියල් **110,000/-** වටිනා ආරක්ෂණ ඇපකරයක් තැබිය යුතු අතර, එම ඇපකරය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බැංකුවකින් ලබාගත යුතු වන අතර එය **2024.07.31** දින දක්වා වලංගු එකක් විය යුතුය.

8. ඒ අනුව, අදාළ ආරක්ෂක සේවා සැපයීමට උනන්දුවක් දක්වන පාර්ශවයන් විසින් අදාළ ආරක්ෂක සේවාව පිළිබඳ සියලු විස්තර සමඟ ලංසු ඉදිරිපත් කල යුතුය. ලංසු මුල් පිටපත හා අනු පිටපත ලෙස පිටපත් දෙකකින් සකස් කර එම පිටපත් වෙන් වශයෙන් කවර දෙකක බහා, ඒවායේ “මුල් පිටපත” හා “අනු පිටපත” ලෙසට සටහන් කොට, එම කවර යලි මුද්‍රා තැබූ තනි කවරයක බහා ඉදිරිපත් කළ යුතුය.

9. අදාළ ලංසු බහාලූ කවරයේ වම් ඉහළ කෙලවරේ **“ආරක්ෂක සේවා සැපයීම - 2024”** යනුවෙන් සඳහන් කළ යුතුය.

10. ලංසු සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස කොළඹ 07 යන ලිපිනයට **2024.04.18 දින ප.ව. 3.30** ට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු හා ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් යොමු කරනු ලබන ලංසු භාරගනු නොලබන අතර, ඒවා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. අදාළ බාර ගැනීමේ කාලය අවසන් වූ වහාම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නව රැස්වීම් ශාලාවේ දී ලැබී ඇති ලංසු විවෘත කරනු ලබන අතර, ලංසුකරු හට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකු හට එම අවස්ථාවට පැමිණ සිටීමට අවසර ඇත.

12. ලංසු පිළියෙල කිරීමේදී හෝ ලැබීමට සැලැස්වීමේදී ලංසුකරුවන්හට සිදුවිය හැකි යම් පිරිවැය හෝ වියදම් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව කිසිදු වගකීමක් නොදරයි.

සභාපති
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
අංක 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07
2024.03.29.